විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක: 3 / 2017

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/2017,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.
2017.10. 16

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් ,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>විශ්‍රාමිකයන්ට නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම</u>

"ආයතන සංග්‍රහයේ xvi වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය අනුව විශ්‍රාමිකයෙකුට දුම්රිය බලපත්‍ර හිමිකම" යන මැයෙන් නිකුත් කරන ලද 2017.09.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක :25/2017 කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

02. ඒ අනුව 2017.01.01 දින සිට විශ්‍රාමිකයෙකුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට යෑමට හා ඊමට දෙන බලපත්‍ර තුනක් (එනම් කට්ටල තුනක්) හිමි වේ.

03. ඉහත සංශෝධනය ප්‍රකාර මවිසින් නිකුත් කර ඇති 2016.10.21 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක:5/2016 හි 07 (III) වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"විශ්‍රාමිකයන් හට වසරකට දුම්රිය බලපත්‍ර කට්ටල තුනකට හිමිකම ඇත.කට්ටල තුනක් යනුවෙන් අදහස් කරන්නේ(යාම සහ ඒම සඳහා වූ) ත්‍රිත්ව ගමන් වාර තුනක් හෝ තනි ගමන් වාර හයකි.විශ්‍රාමිකයන් සඳහා නිදන, නිරීක්ෂණ, වායුසමීකරණය කළ, වෙන්කළ මැදිරි පහසුකම් ලැබීමට හිමිකම ඇත. විශ්‍රාමිකයාගෙන් යැපෙන්නන් සඳහා ද මෙම හිමිකම ලැබේ."

ඒ.ජගත් ඩී.ඩයස්

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | කරු.දැ.ගැ. සඳහා |
| 2. | අග්‍රාමාත්‍ය ලේකම් | - | එම |
| 3. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් | - | එම |
| 4. | ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | - | එම |
| 5. | ලේකම්, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - | එම |
| 6. | ලේකම්, ප්‍රවාහන හා ගුවන් සේවා අමාත්‍යාංශය | - | එම |
| 7. | ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - | එම |
| 8. | සාමාන්‍යාධිකාරී, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | - | එම |
| 9. | විගණකාධිපති | - | එම |